**වැලිමඩ ප්‍රාදේශීය සභාව - 2022**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වැලිමඩ ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට වැලිමඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී නිම කර තිබුණු ඉදිකිරීම්වල වටිනාකම් ප්‍රාග්ධනිත කිරීමේදී රු.550,705 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේදී ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | ප්‍රාග්ධන වැය නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී සභාව මඟින් ඉදිකර තිබුණු කැප්පෙටිපොළ වෙළඳ සංකර්ණයේ වැඩ අවසන් කිරීමට පෙර රු.18,928,961 ක් ප්‍රාග්ධනිත කර තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී සභා අරමුදල් මඟින් ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබුණු රු.1,928,206 ක් වූ කර්මාන්ත 22 ක් ණය හිමි ලෙස ගිණුම්ගත කර තිබුණි. | -එම- | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලිපිද්‍රව්‍ය අවසන් තොගය රු.2,190,270 ක් වැඩියෙන් ගණනය කර ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිර්දේශය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතු වටිනාකම රු.249,275,460 ක් වූ ස්ථාවර වත්කම් විෂයයන් 03 ක සහ රු.4,596,549 ක වූ අවසන් තොග ශේෂය සනාථ කිරීම සඳහා ස්ථාවර වත්කම් ලේඛන, තක්සේරු වාර්තා, පැවරුම් නියෝග, හිමිකම් සහතික, වෙනත් ලේඛන හා උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| | 19(1) වගන්තිය | 2007 ජනවාරි සිට 2020 ඔක්තෝබර් දක්වා කාලය තුළ බඳවාගෙන තිබුණු අනියම් සෞඛ්‍ය කම්කරුවන් 26 දෙනෙක් සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය සමාලෝචිත වර්ෂය දක්වාම ලබාගෙන නොතිබුණි. | ඉදිරියේදී පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියට යටත්ව අනියම් සේවකයින් බඳවා ගැනීම සිදු කරන බව. | අනුමැතිය ලබාගෙන සේවකයින් බඳවාගත යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාද ජනරජයේ ආයතන සංග්‍රහය XXIV පරිච්ඡේදයේ 1.6 හා 4 වගන්ති | විශ්‍රාම ගිය, සේවය අතහැර ගිය හා මියගිය නිලධාරීන් 13 දෙනෙකුගෙන් 2005 වර්ෂයට පෙර සිට පැවත එන රු. 218,358 ක හිඟ සේවක ණය ශේෂ සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාද අය කරගෙන නොතිබුණි. | අදාළ විස්තර සොයා නීත්‍යානුකූලව කටයුතු කරන බව. | හිඟ සේවක ණය අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ඇ) | 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ සංශෝධිත පනත 2 (1) ඇ වගන්තිය | සභාවේ සභිකයින් 28 දෙනෙකු විසින් 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම වාර්ෂික වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි. | සභිකයින් වෙත දැනුම් දුන් නමුත් මෙතෙක් වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දී නොමැති බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව වත්කම් හා බැරකම් ප්‍රකාශ සෑම සභිකයෙකුගෙන්ම ලබා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.95,113,331 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.48,298,295 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් බදු | 5,657,070 | 6,037,055 | 1,579,631 | 4,457,424 | 5,814,509 | 6,109,765 | 1,996,443 | 4,113,322 |
| (ii) | කුලී | 43,031,435 | 40,776,566 | 38,538,196 | 2,238,370 | 20,464,530 | 16,814,592 | 14,280,612 | 2,533,980 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 3,382,659 | 3,748,759 | 3,748,759 | 0 | 2,648,400 | 3,397,666 | 3,397,666 | 0 |
| (iv) | වෙනත් ආදායම් | 62,006,073 | 92,611,271 | 39,315,570 | 53,295,701 | 37,619,000 | 59,874,126 | 20,639,554 | 39,234,572 |
| | එකතුව | 114,077,237 | 143,173,651 | 83,182,156 | 59,991,495 | 66,546,439 | 86,196,149 | 40,314,275 | 45,881,874 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| (i) සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද වරිපනම් බදු ආදායම වූ රු.2,800,000 කින් වර්ෂය තුළ අයකළ ආදායම රු.1,718,610 ක් වූ අතර, එය බිල්කළ ආදායමෙන් සියයට 61 ක් විය. | රටේ පැවති අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් මෙම තත්ත්වය ඇති වූ බව. | හිඟ හිටි වරිපනම් බදු කඩිනමින් අයකර ගත යුතුය. |
| (ii) සමාලෝචිත වර්ෂය ආරම්භයේ තිබුණු ඉකුත් වර්ෂවල හිඟ වරිපනම් බදු ආදායම වූ රු.3,278,292 ක් වූ අතර වර්ෂය තුළදී රු.578,313 ක් අය කරගෙන තිබුණි. ඒ අනුව හිඟ වරිපනම් බදු අයකිරීම ප්‍රතිශතය සියයට 17 ක් තරම් අඩු අගයක් විය. | -එම- | -එම- |
| **(ආ) කුලී** | | |
| 2015 වර්ෂයට පෙර සිට පැවත එන රු. 127,435 ක හිඟ කඩ කාමර කුලී සමාලෝචිත වර්ෂයේ අවසානයටද අය කරගෙන නොතිබුණි. | නීත්‍යානුකූලව කටයුතු කර හිඟ මුදල් අය කරන බව. | හිඟ හිටි කඩකුලී අයකර ගත යුතුය. |

(ඇ) **ජල ගාස්තු**

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවට අයත් බෝගස්ඇල්ල, ලන්දේගම සහ දඹවින්න-ඩයරබා ජල ව්‍යාපෘති වලින් වසර 09 ක කාලයක සිට පැවත එන හිඟහිටි ජල ගාස්තු රු.296,190 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ජංගම සේවා පවත්වමින් හිඟ හිටි ජල ගාස්තු අය කරන බව. | හිඟ ජල ගාස්තු අයකර ගත යුතුය. |

**2.3** අධිභාර

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා ආඥා පනතේ 172 (3) වගන්තිය අනුව 2019 වර්ෂයේදී විගණකාධිපති විසින් පනවා තිබුණු එකතුව රු.764,114 ක් වූ අධිභාර 02 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනටද අය කරගෙන නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් සිට රු.1,000 බැගින් ගෙවා ඇත. ඉතිරි අධිභාර මුදල් අය කර ගන්නා බව. | හිඟ අධිභාර අය කර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගෙන නොතිබුණු පෞද්ගලික ගෝඝාතකාගාර 03 ක් සඳහා දින 14න් 14 ට අලුත් වන පරිදි තාවකාලික වෙළඳ බලපත්‍ර ලබාදී තිබුණි. | මධ්‍යම පරිසර අධිකාරියේ පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබා ගෙන නොමැත. ඉදිරියේදී ඒ සම්බන්ධ ක්‍රියාමාර්ග ගන්නා බව. | සෝ ගාතකාගාර සඳහා විධිමත් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2008 වර්ෂයේ සිට ක්‍රියාත්මක කර තිබුණු සභාවට අයත් දිවිතොටවෙල පිහිටි ආදාහනාගාරය සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබාගෙන නොතිබුණි. | පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනීම සිදු කරමින් පවතින බව. | ආදාහනාගාරය සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබා ගත යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන මණ්ඩලයේ ලියාපදිංචි හෝටල්, ආපනශාලා නවැතැන් පොළ වලින් ඉකුත් වර්ෂයේ ආදායමෙන් සියයට 01 ක් බලපත්‍ර ගාස්තු ලෙස අය කරගෙන නොතිබුණි. | මුදල් අය කිරීමට ආදායම් පරීක්ෂකවරුන්ට පවරා ඇති බව. | සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල් සහ ආපනශාලා හඳුනාගෙන බදු මුදල් අය කරගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති 1980/46 අංක දරන ලිපිය සහ බදු ගිවිසුමෙහි අංක 02 කොන්දේසිය අනුව වසර 05 කට වරක් බදුකුලිය ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත තීරණය කර නොතිබුණි. | තක්සේරු නොකළ කඩ කාමර සම්බන්ධයෙන් නව තක්සේරුවක් සිදු කර දෙන ලෙස තක්සේරු දෙපාර්තුමේන්තුව වෙත ඉල්ලීම් කර ඇති බව. | විධිමත් තක්සේරුවක් සිදු කර ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් කඩ කාමර බදු දීමට කටයුතු කළ යුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී සභාවට අයත් බැකෝ ලෝඩර් යන්ත්‍රයට රු.1,173,565 ක ඉන්ධන ලීටර් 4665 ක් යොදා තිබුණද, වර්ෂය තුළ ආදායම් උත්පාදන කටයුතුවල යොදවා නොතිබුණු අතර, බැකෝ ලෝඩරය සභාවේ සුභසාධන කටයුතු වෙනුවෙන් යොදාගෙන තිබුණු බවට තහවුරු කරගැනීම සඳහා ඇස්තමේන්තු, සභා තීරණ සහ තාක්ෂණික නිලධාරි වාර්තා විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | විගණනයට ඉදිරිපත් නොවී ඇති තොරතුරු කඩිනමින් ඉදිරිපත් කරන බව. | යන්ත්‍ර සූත්‍ර යොදාගෙන කටයුතු සිදු කිරීමේදී ඒ සම්බන්ධ තාක්ෂණික නිළධාරීගේ ඇස්තමේන්තු සහ වැඩ නිමකළ බවට වාර්තා පවත්වා ගත යුතුය. |